

2021

# දැනුම ගන්න - පුහුණු වන්න

## බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව
## පුහුණු අංශය

**පත්‍රිකා අංක - SCS/Tr/2021/04**



### බීජ වගාවන් ලියාපදිංචි කිරීමේදී සලකා බැලිය යුතු කරුණු

01. බීජ පනතේ ලියාපදිංචි වී ඇති බව තහවුරු කර ගැනීම.
02. තවාන් දමා වගා කරන බෝගවල තවාන් පරීක්ෂා කර තිබීම.
03. ක්ෂේත්‍රයේ වගා ඉතිහාසය
04. සහතික කිරීමට ඉල්ලුම් කර තිබීම හා එය සහතික කිරීම අනුමත කර තිබීම.
05. වගාවට යෙදූ බීජවල සම්භවය (මූලාරම්භය) සහතික පරීක්ෂා කර සහතික කල තොගයක් බව තහවුරු කර ගැනීම.
06. වගාවේ ප්‍රභේදය තහවුරු කර ගැනීම.
07. වපසරිය තහවුරු කර ගැනීම හා වගාවට යොදාගත් බීජ ප්‍රමාණය අනුව වපසරිය පිළිබඳ සෑහිමකට පත්වීම.
08. වගාවේ තත්වය හා නියමිත පැළ ගහනය පරීක්ෂා කිරීම.
09. වපසරිය තහවුරු කර ගැනීම හා වගාවට යොදාගත් බීජ ප්‍රමාණය හා බෝගය පිහිට වූ ක්‍රමවේදය අනුව වපසරිය පිළිබඳ සෑහිමකට පත්වීම.
10. අදාළ බෝග වෙන් කිරීමේ පරතරය (Isolation Distance) තිබේදැයි පරීක්ෂා කිරීම.
11. පුද්ගලික ගොවිපලක් නම් අදාළ සහතික කිරීමේ ගාස්තු අය කිරීම.
12. ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි තිබීම.

### බීජ සහතික කිරීමේදී අයකරන ගාස්තු

| | |
|---|---|
| වී, අතිරේක ආහාර බෝග, එළවළු සඳහා අවම ගාස්තුව අක්කරයට | රු. 400.00 |
| අර්තාපල් අක්කර 01 ක් සහතික කිරීම සඳහා ගාස්තුව | රු. 800.00 |
| බීජ නියැදියක සම්පූර්ණ පරීක්ෂණයක් සඳහා පරීක්ෂණාගාර ගාස්තු | රු. 345.00 |
| බීජ නියැදියක පැලවීම පමණක් පරීක්ෂා කිරීම සඳහා | රු. 172.00 |
| බීජ නියැදියක තෙතමනය පමණක් පරීක්ෂා කිරීම සඳහා | රු. 57.00 |
| C නියැදි පරීක්ෂණයක් සඳහා | රු. 172.00 |
| කුඩා ඇසුරුම් වලට යොදන ස්ටිකරයක් | රු. 1.50 |
| බීජ නියැදියක සම්පූර්ණ පරීක්ෂණයක් සඳහා (ආනයනික බීජ) | රු. 460.00 |

කලින් කලට සිදුකරන මිල ගණන් වෙනස්වීම් වලට යටත් වේ.

## බීජ වගාව සහතික කිරීම සඳහා ලියාපදිංචි කිරීම

01. වගාව ලියාපදිංචි කර මුල් පිටපත නිෂ්පාදකයාට ලබාදීම.

02. පුද්ගලික බීජ නිෂ්පාදකයින්ට අදාළ සහතික කිරීමේ ගාස්තු ගෙවා තිබීම.

03. බීජ නිෂ්පාදනය සඳහා බීජ සහතික කිරීමේ සේවයේ නිලධාරීන් විසින් ලබාදෙන වාර්තා.

04. ප්‍රාදේශීය කාර්යාලයේ ඇති අදාළ ලේඛනයේ විස්තර ඇතුලත් කිරීම.

05. ලියාපදිංචි කිරීමේ පිටපත වහාම බීජ සහතික කිරීමේ මූලස්ථානය වෙත එවීම.

06. ලියාපදිංචි නොකල වගාවන් පිළිබඳ අදාළ නිෂ්පාදකයින් , කොන්ත්‍රාත්කරුවන් ඊට හේතුව සඳහන් කර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බී.ස.සේ) වද පිටපතක් සහිතව ලිඛිතව දැනුම් දීම. (මූලික ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් මඟින්)

07. අදාළ තොරතුරු සියල්ල උපදෙස් දී ඇති පරිදි පරිගණක ගත කිරීම.

## ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරන අවස්ථා

- බීජ පනතේ ලියාපදිංචි නොවීම.
- මූලාරම්භක ලේබල් ඉදිරිපත් නොකිරීම.
- අවම වපසරිය නොමැති වීම.
- බෝග වෙන්කිරීමේ පරතරය නොතිබීම.
- වගාව රෝග පළිබෝධ හානි වලට තදබල ලෙස ලක්වී තිබීම.
- ප්‍රභේදය තහවුරු කර ගැනීමට නොහැකි වීම.
- නියමිත පැල ගහනය නොමැති වීම.
- අධික වල් පැළෑටි ගහනයක් තිබීම.
- වල් වී තිබීම.
- ඉඩමේ අයිතිය තහවුරු නොකිරීම.
- ඉඩමේ සහ වගාවේ සනීපාරක්ෂක තත්වය මත

*කොරෝනා මර්දනය කර - සෞභාග්‍යමත් දේශයක් ගොඩනගමු*

*වැඩි විස්තර සඳහා*
**බීජ සහතික කිරීමේ සේවය, ගන්නෝරුව**
දුරකථන:-
081-2388217
ෆැක්ස්:-
081-2388217
ඊමේල්:-
scsdoa79@gmail.com

*උපුටා ගැනීම :-* බීජ සහතික කිරීමේ සේවයේ ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා අත්පොතෙනි.
මෙහි තොරතුරු සියල්ල බීජ සහතික කිරීමේ සේවය, ගන්නෝරුව සතුය.

*උපදේශකත්වය* - අධ්‍යක්ෂ (බීජ සහතික හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, ගන්නෝරුව)
අතිරේක අධ්‍යක්ෂ (බීජ සහතික කිරීමේ සේවය, ගන්නෝරුව)

*සැකසුම හා නිර්මාණය* - පුහුණු අංශය හා ක්ෂේත්‍ර පරිපාලන අංශය,බීජ සහතික කිරීමේ සේවය,ගන්නෝරුව